iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

6 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2022(2023) | 11 S

නම: ..............................................

# බුද්ධ ධර්මය

කාලය පැය දෙකයි

- **පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 02 ක් හිමිවේ.**

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බෝසත් කුමරු ඉපදුනේ
  1. ඇසළ පෝ දාය. 2. දුරුතු පෝ දාය. 3. වෙසක් පෝ දාය. 4. පොසොන් පෝ දාය.

02. සිදුහත් කුමරුගේ සුළු මව මෙතුමියයි.
  1. යසෝදරා දේවිය 2. ප්‍රජාපතී ගෝතමී දේවිය
  3. මහාමායා දේවිය 4. කිසාගෝතමී දේවිය

03. පස්මහ බැලුම් වලට අයත් නොවන්නේ,
  1. දීපය 2. කුලය 3. කාලය 4. මෙත්තා

04. වන්දාමි චේතියං සබ්බං .......................... යන ගාථාව කියමින් වන්දනා කරන්නේ,
  1. මල් 2. ගිලන්පස 3. ත්‍රිවිධ චෛත්‍යය 4. ගිලන්පස

05. ශ්‍රී ලංකාවේ පැවිදි වූ මුල් ම කාන්තාව වූයේ,
  1. අනුලා දේවිය 2. පටාචාර දේවිය 3. සංඝමිත්තා දේවිය 4. යසෝදරා දේවිය

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න වල සඳහන් වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුන් වහන්සේ ථූපාරාම චෛත්‍යයේ නිධන් කර ඇත. ( )

07. ලෝක පරිසර දිනය ජූනි 08 වන දිනයි. ( )

08. මංගල, සුමන, රේවත යන බුදුරජාණන් වහන්සේලා බුද්ධත්වයට පත් වූයේ නාගස් සෙවනක ය. ( )

09. සීලය යනු සිත, කය හා වචනය සංවර කර ගැනීමයි. ( )

10. මෛත්‍රී භාවනාවේ ආනිසංසයකි නපුරු සිහින දැකීම. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වල A කොටසේ දැක්වෙන ප්‍රකාශ හා සම්බන්ධ වන පිළිතුරු B කොටසින් තෝරා ඉරකින් යා කරන්න.

| A | B |
|---|---|
| 11. සිල්වත් බව | බුද්ධානු මතං |
| 12. වැඩිහිටි උපදෙස් ලැබීම | සීලං |
| 13. දැහැමිව ජීවත් වීම | ආරෝග්‍ය |
| 14. කම්මැලි නොවීම | ධම්මානු වත්තී |
| 15. නිරෝගී බව | අලීනතා |

iskolee.com

**• අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහනින් තෝරා යටින් ඉරක් අඳින්න.**

16. සුදොවුන් රජතුමා තම පුත් කුමරුට දෙවන වරට වැන්දේ .......................................................... ය.
(වප්මඟුල් දින / නම් තැබීමේ දින)

17. සම්මා වාචා වලට අයත් මාර්ග අංගයකි. ........................................... (ප්‍රාණඝාතය / සත්‍ය වචන කීම)

18. සිල්වත් වීමේ ආනිසංසයක් වන්නේ, ............................................................................
(කීර්තිය පැතිරීම/මරණින් පසු දුගතියට යාම)

19. විරමනය යනු .................................................... (හරිදේ කිරීම / වැරදි දෙයින් වැළකීම)

20. පුබ්බේනිවාසානුස්සති ඥාණය යනු ...................................... (ත්‍රිවිද්‍යා / ත්‍රී ශික්‍ෂා ) වන්ගෙන් එකකි.

## II කොටස

**• පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

(01) i. බෝසත් කුමරු මහාමායා දේවියගේ කුස පිළිසිඳ ගත්තේ කිනම් පෝය දිනක ද?
ii. "අයමන්තිමා ජාති නත්ථිදානෝ පුනබ්භවෝ" මෙහි තේරුම ලියන්න.
iii. අපේ රටේ අනන්‍යතාවය පෙන්නුම් කරන ජාතික සංකේත දෙකක් ලියන්න.
iv. මිහිඳු හිමි සමඟ වැඩම කළ රහතන් වහන්සේලා දෙනමකගේ නම් ලියන්න.
v. පන්සිල් වල තුන්වන සිල්පදය ලියා එහි තේරුම ලියන්න.
vi. "කායේන වාචා චිත්තේන" .......... යන ගාථාව සම්පූර්ණ කරන්න.
vii. ඔබ විහාරයට ගොස් වන්දනා කරන අනු පිළිවෙළ ලියන්න.
viii. සිරිත් විරිත් යන වචන දෙකෙහි තේරුම් වෙන වෙනම ලියන්න.
සිරිත් ........................................
විරිත් ........................................
ix. පස්මහ බැලුම් අතරින් දෙකක් ලියන්න.
x. මෛත්‍රී භාවනාවේ ආනිසංස දෙකක් ලියන්න. (ලකුණු 2x10 = 20)

(02) i. බෝසත් කුමරු උපත ලැබූ සල් උයනේ නම ලියන්න.
ii. සත් පියුම් මත වැඩි බෝසත් කුමරුගේ සිංහ නාදය ලියන්න.
iii. මහාමායා දේවිය දුටු සිහිනය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2+3+5 = 10)

(03) i. සීලය යනු කුමක් ද?
ii. ත්‍රි ශික්ෂාවෙහි සීල ශික්ෂාවට අයත් අංග තුන ලියන්න.
iii. සිල්වත්ව කටයුතු කිරීමෙන් ලැබෙන ආනිසංස පහ නම් කරන්න. (ලකුණු 2+3+5 = 10)

(04) i. තංච කම්මං කතං සාධු ................. යන ගාථාව සම්පූර්ණ කරන්න.
ii. එහි තේරුම ලියන්න.
iii. ඔබට සතුටු විය හැකි ක්‍රියාකාරකම් පහක් ලියන්න. (ලකුණු 2+3+5 = 10)

(05) i. සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න.
ii. දෙමාපියන් විසින් තම දරුවන්ට ඉටුකළ යුතු යුතුකම් 03 ක් ලියන්න.
iii. දෙමව්පියන්ගෙන් දරුවන්ට සැලසෙන යහපත ලියන්න. (ලකුණු 2+3+5 = 10)

(06) i. සමනාමයං මහාරාජ ධම්ම රාජස්ස සාවකා ............................
මෙම ගාථාව දේශනා කළේ කවුද? කා හටද ?
ii. හිස්තැන් පුරවන්න.
a. ලංකාවේ ඉදිකළ මුල්ම පන්සල .......................................................

iskolee.com

b. ලංකාවේ පැවිදි වූ මුල්ම භික්ෂූන් වහන්සේ ...........................................

c. ලංකාවේ පැවිදි වූ මුල්ම භික්ෂුනීන් වහන්සේ ..........................................

iii. පහත වචන වලට අදාළ ශාසනික වචන ලියන්න.

1. මිදුල අතුගානවා - ..........................................................
2. ආහාර අනුභව කරනවා - ..........................................................
3. අත සෝදනවා - ..........................................................
4. තේ, කෝපි වැනි බීම වර්ග - ..........................................................
5. බුලත් විට - .......................................................... (ලකුණු 2+3+5 = 10)

(07) පහත දැක්වෙන මාතෘකා වලින් දෙකකට කෙටි සටහන් ලියන්න.

1. සංඝමිත්තා රහත් තෙරණින් වහන්සේ
2. මහාමායා දේවිය
3. ශ්‍රද්ධාව
4. ජීවක වෛද්‍යතුමා (ලකුණු 10)

iskolee.com

# තෙවන වාර පරීක්ෂණය - 2022

බුද්ධ ධර්මය

**පිළිතුරු පත්‍රය**

6 ශ්‍රේණිය

| | | | |
|---|---|---|---|
| 1 - 2 | 6 - ✓ | 11 - සීලං | 16 - වප් මඟුල් දින |
| 2 - 3 | 7 - ✗ | 12 - වුද්ධානු මතං | 17 - සත්‍ය වචන කීම |
| 3 - 4 | 8 - ✓ | 13 - ධම්මානු වත්තී | 18 - කීර්තිය පැතිරීම |
| 4 - 3 | 9 - ✗ | 14 - අලීතනා | 19 - වැරදි දෙයින් වැළකීම |
| 5 - 1 | 10- ✗ | 15 - ආරෝග්‍ය | 20 - ත්‍රිවිද්‍යා |

( 2 x 20 = 40)

**II කොටස**

(01)i. ඇසළ පෝ දිනක

ii. මේ මගේ අවසන් උපතයි. නැවත උපතක් නැත.

iii. ජාතික කොඩිය, ජාතික ගීතය, ජාතික වෘක්ෂය, ජාතික පුෂ්පය යන ඒවායින් 2 ක්

iv. ඉට්ටිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලාගෙන් දෙනමක්

v. කාමේසු මිච්ඡාචාර වේරමණී සික්ඛා පදං සමාදියාමි. - මම කාමෙහි වරදවා හැසිරීමෙන් වළකිමි.

vi. කායේන වාචා චිත්තේන පමාදේන මයා කතං
අච්චයං ඛම මේ භන්තේ - භූරිපඤ්ඤ තථාගත

vii. 1. චෛත්‍ය වහන්සේ 2. බෝධීන් වහන්සේ 3. පිළිම වහන්සේ

viii. සිරිත් - කළ යුතු දේ / නිවැරදි දෙය
විරිත් - නොකළ යුතු දේ / වැරදි දෙය

ix. කාලය, දීපය, දේශය, කුලය, මව යන ඒවායින් දෙකක්

x. ලියා ඇති පිළිතුරට අදාළව ලකුණු ලබා දෙන්න. ( 2 x 10 = 40)

(02)i. ලුම්බිණි සල් උයන

ii. අග්ගෝ හමස්මි ලෝකස්ස - ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස
සෙට්ඨෝ හමස්මි ලෝකස්ස - අයමන්තිමො ජාති නත්ථිදානි පුනබ්බභෝ

iii. ලියා ඇති පිළිතුරට අදාළව ලකුණු ලබා දෙන්න.

(03)i. කය, වචනය සංවර කර ගැනීමයි.

ii. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව

iii.
- මහත් වූ භෝග සම්පත් ලැබීම.
- කීර්තිය පැතිරීම
- ඕනෑම පිරිසක් මැදට නොබියව යා හැකිවීම.
- මරණයට බිය නැති වීම.
- මරණින් මතු සුගතියේ ඉපදීම.

(04)i. තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පතී
යස්ස පතීතො සුමනො - විපාකං පටි සේවතී

ii. යම් ක්‍රියාවක් නිසා පසුතැවිල්ල ඇති නොවේ ද? ♦ එහි විපාකය සොම්නසින් විඳිය හැකි වේද
♦ එවැනි ක්‍රියා කිරීම හොඳය.

iii. ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න.

(05)i. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා

ii. පවින් වැළැක්වීම / යහපතෙහි යෙදවීම
ශිල්පය ලබාදීම / සුදුසු වයසේ දී ආවාහ විවාහ කරදීම / සුදුසු කළ දායාද පවරා දීම.
මින් ඕනෑම තුනක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

iii. පිළිතුරට අදාළව ලකුණු ලබා දෙන්න.

(06)i. දේශනා කළේ - මිහිඳු මහ රහතන් වහන්සේ
කා හට ද? - දේවානම් පියතිස්ස රජතුමාට

ii. a. කාලපාසාද පිරිවෙන b. අරිට්ඨ භික්ෂූන් වහන්සේ c. අනුලා භික්ෂුණීන් වහන්සේ
1. මළුව අමදිනවා 2. දානය වළඳනවා
3. අත් දෝවනය කරනවා 4. ගිලන්පස 5. දැහැත්

(07) මාතෘකාවට අදාළව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iskolee.com

# තෙවන වාර පරීක්ෂණය - 2022

බුද්ධ ධර්මය

**පිළිතුරු පත්‍රය**

6 ශ්‍රේණිය

| | | | |
|---|---|---|---|
| 1 - 2 | 6 - ✓ | 11 - සීලං | 16 - වප් මඟුල් දින |
| 2 - 3 | 7 - ✗ | 12 - වුද්ධානු මතං | 17 - සත්‍ය වචන කීම |
| 3 - 4 | 8 - ✓ | 13 - ධම්මානු වත්තී | 18 - කීර්තිය පැතිරීම |
| 4 - 3 | 9 - ✗ | 14 - අලීතනා | 19 - වැරදි දෙයින් වැළකීම |
| 5 - 1 | 10- ✗ | 15 - ආරෝග්‍ය | 20 - ත්‍රිවිද්‍යා |

( 2 x 20 = 40)

## II කොටස

(01)i. ඇසළ පෝ දිනක

ii. මේ මගේ අවසන් උපතයි. නැවත උපතක් නැත.

iii. ජාතික කොඩිය, ජාතික ගීතය, ජාතික වෘක්ෂය, ජාතික පුෂ්පය යන ඒවායින් 2 ක්

iv. ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලාගෙන් දෙනමක්

v. කාමේසු මිච්ඡාචාර වේරමණී සික්ඛා පදං සමාදියාමි. - මම කාමෙහි වරදවා හැසිරීමෙන් වළකිමි.

vi. කායේන වාචා චිත්තේන පමාදේන මයා කතං
අච්චයං ඛම මේ භන්තේ - භූරිපඤ්ඤ තථාගත

vii. 1. චෛත්‍ය වහන්සේ 2. බෝධීන් වහන්සේ 3. පිළිම වහන්සේ

viii. සිරිත් - කළ යුතු දේ / නිවැරදි දෙය
විරිත් - නොකළ යුතු දේ / වැරදි දෙය

ix. කාලය, දීපය, දේශය, කුලය, මව යන ඒවායින් දෙකක්

x. ලියා ඇති පිළිතුරට අදාළව ලකුණු ලබා දෙන්න. ( 2 x 10 = 40)

(02)i. ලුම්බිණි සල් උයන

ii. අග්ගෝ හමස්මි ලෝකස්ස - ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස
සෙට්ඨෝ හමස්මි ලෝකස්ස - අයමන්තිමො ජාති නත්ථිදානි පුනබ්භවෝ

iii. ලියා ඇති පිළිතුරට අදාළව ලකුණු ලබා දෙන්න.

(03)i. කය, වචනය සංවර කර ගැනීමයි.

ii. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව

iii.
- මහත් වූ භෝග සම්පත් ලැබීම.
- කීර්තිය පැතිරීම
- ඕනෑම පිරිසක් මැදට නොබියව යා හැකිවීම.
- මරණයට බිය නැති වීම.
- මරණින් මතු සුගතියේ ඉපදීම.

(04)i. තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති
යස්ස පතීතො සුමනො - විපාකං පටි සේවති

ii. යම් ක්‍රියාවක් නිසා පසුතැවිල්ල ඇති නොවේ ද? ♦ එහි විපාකය සොම්නසින් විඳිය හැකි වේද
♦ එවැනි ක්‍රියා කිරීම හොඳය.

iii. ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න.

(05)i. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා

ii. පවින් වැළැක්වීම / යහපතෙහි යෙදවීම
ශිල්පය ලබාදීම / සුදුසු වයසේ දී ආවාහ විවාහ කරදීම / සුදුසු කළ දායාද පවරා දීම.
මින් ඕනෑම තුනක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

iii. පිළිතුරට අදාළව ලකුණු ලබා දෙන්න.

(06)i. දේශනා කළේ - මිහිඳු මහ රහතන් වහන්සේ
කා හට ද? - දේවානම් පියතිස්ස රජතුමාට

ii. a. කාලපාසාද පිරිවෙන b. අරිට්ඨ භික්ෂූන් වහන්සේ c. අනුලා භික්ෂුණීන් වහන්සේ
1. මළුව අමදිනවා 2. දානය වළඳනවා
3. අත් දෝවනය කරනවා 4. ගිලන්පස 5. දැහැත්

(07) මාතෘකාවට අදාළව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.